**ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ජාතික බුද්ධිමය දේපළ අරමුදල - 2013**

---

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ජාතික බුද්ධිමය දේපළ අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 176 (6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 **විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීත්තර විගණන ආයතනයේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික බුද්ධිමය දේපළ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 අනුව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත්කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාල වවුචර්, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු තුලින් ජනිත වූ මූල්‍ය ප්‍රතිඵලය රු.49,692,263 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.47,715,331 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.1,976,932 කින් වර්ධනය වීම සඳහා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම රු.2,185,492 කින් අඩුවීම විශේෂයෙන් බලපා තිබුණි

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

4.1.1 **වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම**

ලබා ගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාලව වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදංචි කිරීම පිළිබඳ කාර්ය සාධනය පහත සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

| | **වෙළඳ ලකුණු ලියාපදිංචිය** | | **පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය** | | **කාර්මික සැලසුම් ලියාපදිංචිය** | |
|---|---|---|---|---|---|---|
| | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** |
| පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 28,720 | 22,538 | 1,525 | 1,287 | 955 | 823 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වර්ෂය තුළ ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 8,825 | 9,036 | 516 | 539 | 346 | 394 |
| වර්ෂය තුළ ලියාපදිංචි කළ යුතු සංඛ්‍යාව | 37,545 | 31,574 | 2,041 | 1,826 | 1,301 | 1,217 |
| වර්ෂය තුළ ලියාපදිංචි කළ සඛ්‍යාව | 1,485 | 2,854 | 236 | 301 | 130 | 262 |
| ඉදිරි වර්ෂයට ගෙන ගිය ලියාපදිංචි නොකළ සංඛ්‍යාව | 36,060 | 28,720 | 1,805 | 1,525 | 1,171 | 955 |
| කෙරීගෙන යන ලිපිගොනු සංඛ්‍යාව | 16,400 | - | 1,730 | - | 729 | - |
| කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් ලිපිගොනු සංඛ්‍යාව | 19,660 | | 75 | | 442 | |
| කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් ඉල්ලුම්පත් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස | 55 | | 4 | | 38 | |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛන හා තොරතුරු ප්‍රගති වාර්තා අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් ඉහත දත්තවල නිරවද්‍යතාවය පිළිබඳ ගැටලු මතුවීම වැළැක්විය නොහැකිය.

(ආ) ඉහත සඳහන් තොරතුරු අනුව වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලසුම් ලියාපදිංචිය ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ප්‍රධාන කාර්යය වුවද, එම කාර්ය ඉටු කිරීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. මේ නිසා නව නිර්මාණකරුවන් අධෛර්යට පත්වීම සහ නිසි කලට ලියාපදංචිය නොලැබීමෙන් නිර්මාණකරුවන්ගේ නව නිර්මාණ තුළින් ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලැබී නොතිබුණි. ඉදිරිපත් කර තිබූ ඉල්ලුම්පත් ප්‍රමාණය කඩිනමින් ලියාපදිංචි කිරීමට 2013 මැයි මාසයේ සිට කැලි පදනම මත ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දී තිබුණද, ඒ සඳහා රු. 305,960 ක අමතර පිරිවැයක් අරමුදලෙන් වැයකර තිබූ නමුත්, වෙළඳ ලකුණු, හා කාර්මික සැලසුම් ලියාපදිංචිය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව බුද්ධිමය දේපළ පහසුකම් සැපයීමේ මධ්‍යස්ථාන 3 ක් පිහිටුවීම සඳහා රු. ලක්ෂ 05 ක් වෙන් කර ගෙන තිබුණද 2013 දෙසැම්බර් 31 දින වන විටත් එකී අරමුණ කරා ලඟා වී නොතිබුණි.

## 4.3 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීම්

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා සුරක්ෂිතාගාරයක් හා අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2008 හා 2009 වර්ෂවලදී එකතුව රු. 22,978,101 ක් වැයකර තිබුණි. අදාල ඉඩමේ අයිතිය සහ පැවැත්ම තහවුරු කර නොගෙන ඉදිකිරීම් සිදු කිරීම නිසා කඩා ඉවත් කිරීමට තීරණය කර තිබූ මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් වැය කරන ලද මුදල නිෂ්කාර්ය වී තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේදී විදේශිය පුහුණුව සඳහා වෙන්කර තිබූ රු. 800,000 ක මුදලින් රු.360,000 ක් ආයතනයේ පරිබාහිර නිලධාරීන් 10 දෙනෙකුට විදේශ පුහුණුව ලබාදීමට වැයකර තිබුණි.

4.5 **කාර්ය මණ්ඩල පරිපාලනය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් තනතුර වසරකට අධික කාලයක සිට පුරප්පාඩුව පැවතියද එම පුරප්පාඩුව පිරවීමට කටයුතු නොකර වැඩ බැලීමට නිලධාරිනියක් පත් කර තිබූ අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 02 ක් හා සහකාර අධ්‍යක්ෂ තනතුරක් පිළිවෙලින් වසර 4 1/2 ක හා වසර 2 1/2 ක කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) බුද්ධිමය දේපළ තාක්ෂණික සහකාර, බුද්ධිමය දේපළ පර්යේෂණ සහකාර, ලේඛන හා දත්ත සහකාර සහ බුද්ධිමය දේපළ නිලධාරී යන තනතුරු 12 ක් හා රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 06 ක 2014 මැයි 31 දින වන විටත් වසර 2 කට අධික කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

5. **ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය**

**----------------------------------------**

5.1 **අභ්‍යන්තර විගණනය**

**-----------------------**

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අරමුදලේ කටයුතු පිළිබඳ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

5.2 **අයවැය ලේඛනමය පාලනය**

**--------------------------------**

අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර, සියයට 17 සිට සියයට 120 ක පරාසයක් දක්වා විචලනයක් සහ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර, සියයට 60 සිට සියයට 100 දක්වා පරාසයක සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන ඒකකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. **පද්ධති හා පාලන**

**-------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම

(ඇ) මානව සම්පත් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය